රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 38/2019

මගේ අංකය : EST-1/MISCL/06/0032(I)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2019.12.23

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2020 වසර - රාජකාරි කටයුතු ඇරඹීම

අතිගරු ජනාධිපතිතුමන් විසින් සිය "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අදාළව ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්, ගුණගරුක, විනයගරුක සාධාරණ සමාජයක් සහ සෞභාග්‍යමත් දේශයක් යන චතුර්විධ අරමුණු ජය ගැනීම සඳහා දස ප්‍රතිඥාවන්ගෙන් යුත් වැඩ පිළිවෙලක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව එළඹෙන 2020 වර්ෂය මෙකී අරමුණු සාක්ෂාත් කර ගැනීමේ පාදක වර්ෂය ලෙස සාර්ව ආර්ථික ඉලක්ක ළඟා කර ගැනීමේ ඒකායන අභිප්‍රායෙන් යුක්තව සියලුම රජයේ සේවකයන් විසින් ද වර්තමාන හා අනාගත පරම්පරාවන්ගේ යහපත උදෙසා කැපවීමෙන් වැඩ කිරීමේ ආකල්පමය වෙනසක් ඇති කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරනු ලැබේ. ඒ සඳහා 2020 වසරේ රාජකාරි අරඹන පළමු දිනය වන ජනවාරි මස 01 වන බදාදා දින සියලුම රාජ්‍ය සේවකයන්ගේ සහභාගීත්වයෙන් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට මෙයින් උපදෙස් දෙමි.

02. එහි ප්‍රධාන නිල උත්සවය ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් එදින පෙ.ව. 9.30 ට ජනාධිපති කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වේ. ඊට සමගාමීව එදින එම වේලාවට ම පහත දැක්වෙන වැඩසටහන ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටම නියෝජනය කරන සියලුම රාජ්‍ය ආයතන සහ කාර්යාලවල පැවැත්වීමට ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන වැඩපිළිවෙළ යොදා ගත යුතු වේ.

I. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉදිරිපිට දී ආයතනයෙහි හෝ කාර්යාලයෙහි ප්‍රධානියා ජාතික ධජය එසවීම. (සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් එක් තැනකට ඒකරාශී කරවීමට බාධා පමුණුවන ඉඩකඩ පිළිබඳ යම් ප්‍රශ්නයක් වෙතොත් සෑම සාමාජිකයෙකුගේ ම සහභාගීත්වය සහතික කෙරෙන පරිදි සුදුසු විකල්ප වැඩපිළිවෙළක් යොදා ගත හැකි ය.)

II. ජාතික ධජය එසවීමෙන් අනතුරුව ජාතික ගීය ගායනා කිරීම.

III. රණවිරුවන් ඇතුළුව දේශය වෙනුවෙන් දිවි කැප කළ සියලුදෙනා සැමරීම සඳහා විනාඩි 02ක නිශ්ශබ්දතාවක් ආරක්ෂා කිරීම.

IV. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් තම තමන්ට පහසු භාෂාවකින් මේ සමඟ එවා ඇති රාජ්‍ය සේවා ප්‍රතිඥාව/ දිවුරුම හඬ නගා කියවීම.

V. සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් තුළ ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්, ගුණගරුක, විනයගරුක සාධාරණ සමාජයක් බිහි කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ සෑම දෙනාගේම දායකත්වය අවංකව, අප්‍රමාදව සහ දැඩි කැපවීමකින් යුතුව ලබා දීමේ අවශ්‍යතාව තේමා කරගත් කෙටි දේශනයක් ආයතනයේ ප්‍රධානියා විසින් පැවැත්වීම.

03. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත් - ගරු පළාත් ආණ්ඩුකාරවරුන්

# රාජ්‍ය සේවයේ ප්‍රතිඥාව/ දිවුරුම

දෙදහස් විස්ස වර්ෂයේ රාජකාරි අරඹන පළමු වැනි දිනය වන අද දින,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, ලක් වැසි ජනතා අපේක්ෂාවන්

යථාර්ථයක් බවට පත් කරන නව වසරක සමාරම්භය සනිටුහන් කරයි.

අදින් ඇරඹෙන නව වසරේ

එකම රටක්, එකම දැයක් තුළ, එක කොඩියක සෙවණේ

එක්සත්ව හා එක්සිත්ව විකසිත වන

සුරක්ෂිත වූ අපගේ මාතෘ භූමිය තුළ

රට හදන සෞභාග්‍යයේ දැක්ම පෙරදැරි කරගත්

විනයගරුක, නීතිගරුක සහ ගුණගරුක සමාජයක් බිහි කිරීමට ද

තිරසර පරිසර කළමනාකරණය මුල්කොටගත්

භෞතික සම්පත් සංවර්ධනය තුළින්

ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහිකිරීමට ද

නූතන තාක්ෂණයෙන් සන්නද්ධ සශ්‍රීක මානව සම්පත මෙහෙයවන

පිරිසිදු රාජ්‍ය පාලනයක කොටස්කරුවෙකු වන මම,

මහජන මුදලින් වැටුප් ලබන රජයේ සේවකයෙකු ලෙස

රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ක්‍රියාත්මක කිරීමෙහි ලා

මා වෙත පැවරෙන්නා වූ කාර්යභාරය

කාර්යක්ෂමව,

සඵලදායීව,

තිර අදිටනින් යුතුව,

උපරිම කැපවීමෙන්,

අවංකභාවයෙන්,

මහජනතාවට පක්ෂපාතීව,

සපුරා ඉටු කරන බවට ප්‍රතිඥා දෙමි/ දිව්රුම් දෙමි.